**කෝරලේයිපත්තු උතුර ප්‍රාදේශීය සභාව - 2017**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු උතුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-----------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් පිළියෙල කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභාවේ යන්ත්‍ර කුලියට දීමෙන් රු.575,700 ක් අයකර ගත යුතුව තිබුණත් මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට 2009 දක්වා අයකර ගත යුතු මුද්දර ගාස්තු රු.747,717 ක් ලැබිය යුතුව තිබුණත් මෙම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සභා නිලධාරීන්ගේ සේවක ණය ලේඛනය ප්‍රකාරව රු.2,193,814 ක් හිඟ හිට තිබුණු බව දක්වා තිබුණත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,534,402 ක් හිඟහිටි ලෙස ඉදිරිපත් කර තිබුණි.

**1.3.3 ලැබිය යුතු මුදල්**
**---------------------**

2013 වර්ෂයේ සිට සේවය හැරගිය අයෙකුගෙන් අයකර ගෙන නොමැති හිඟ ණය රු.148,490 ක් හිඟහිටි ලෙස දක්වා තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 87,251,495 | ඉඩම් හිමිකම් ඔප්පු ස්ථාවර වත්කම් ලේඛන |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 13,088,075 | ස්ථාවර වත්කම් ලේඛන විස්තරාත්මක උපලේඛන |
| ලී බඩු හා උපකරණ | 2,216,219 | |
| ආපසු ගෙවිය යුතු | 5,403,280 | |
| අත්තිකාරම් ගෙවීම් | 3,516,372 | |

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විශ්ලේෂණය කර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති** | |
| | I පරිච්ඡේදයේ 5(XII) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම් ආදිය සඳහා සම්බන්ධිත නිලධාරීන් දෙදෙනෙකුගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල්රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් රු.1,777,967 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 927,396 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,705,363 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් කළමනාකරණය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් JCB යන්ත්‍රය කුලියට දීමෙන් ඔවුන්ගෙන් අයකර ගත යුතු රු.49,000 ක් අයකර නොමැතිව 2018 වර්ෂයේ හිඟහිටව පැවතුණි.

(ආ) 2016 වර්ෂයේ කිසිඳු ගිවිසුමකට එළැඹීමකින් තොරව Vibrating Roller යන්ත්‍රය කුලියට දීමෙන් අයකර ගත යුතු රු.226,800 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.2 වරිපනම් බදු**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල පවතින ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා වරිපනම් බදු අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.1 කාර්යසාධනය**

**තිරසාර සංවර්ධන අරමුණු**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

මඩකලපුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ සංඛ්‍යා ලේඛන අනුව කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින වාකරෙයි රජයේ රෝහලේ 2016 සහ 2017 වර්ෂවලදී ඉපදුනු ළදරුවන් පිළිවෙලින් 77 ක් 81 ක් වශයෙන් පැවැති අතර එම ළදරුවන්ගෙන් අඩු බර වශයෙන් ඉපදුනු ළදරුවන් ගණන පිළිවෙලින් 17 ක් සහ 16 ක් වශයෙන් දක්නට ලැබුණත්, මාතෘ ළදරු සුභසාධනය වෙනුවෙන් 2016

සහ 2017 වර්ෂවලවලදී රු.75,000 ක් සහ රු.50,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණත්, සභාව විසින් මාතෘ ළදරු සුභසාධනය සහ සෞභාග්‍යය වෙනුවෙන් වැයකර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, අනියම් හා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබාගෙන නියමිත මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා වන අවසරය ලබාගැනීමෙන් අනතුරුව පමණක් සේවකයින් අනියම් සහ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත යුතු වුවත්, එලෙස පූර්ව අනුමැතිය සහ අවසරය ලබා ගැනීමකින් තොරව 2016 වර්ෂයේදී සේවකයින් 14 දෙනෙකුත් 2017 වර්ෂයේදී සේවකයින් 04 දෙනෙකුත් වශයෙන් මුළු සේවකයින් 18 දෙනෙකු අනියම් හා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි.

(ආ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අනියම්/ තාවකාලික පදනම මත බඳවා ගනු ලබන සේවකයින් වෙනුවෙන් සේවකයින්ගෙන් සියයට 8 ක දායක මුදලක් හා පළාත් පාලන ආයතනයෙන් සියයට 12 ක දායක මුදලක් එකතු කර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවිය යුතුය. එසේ වුවත්, ඉහත වර්ෂවලදී පත්වීම් ලබාදුන් සේවකයින් 12 දෙනෙකු සඳහා එලෙස දායක මුදල් යවා නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

සභා බල ප්‍රදේශයේ පිහිටි සුසාන භූමි 19 ක අයිතිය නිසි පරිදි ලබාගැනීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ සභාවේ පොල් වත්තට තාවකාලික කූඩාරම් ඉදිකිරිම සඳහා රු.219,375 ක් ගෙවා තිබුණි. භෞතික පරීක්ෂණයේදී නිමකළ වැඩවල වටිනාකම රු.163,164 ක් වශයෙන් පැවතුණු අතර රු.219,375 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීම හේතුවෙන් රු.56,211 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභ කාර්යාල ගොඩනැගිල්ලේ ලීයෙන් දමා තිබූ දොරවල් ගලවා අලුත් ඇළුමිනියම් දොරවල් 7 ක් සවිකිරීම වෙනුවෙන් රු.173,740 ක් ගෙවීම් කර තිබුණි. භෞතික පරීක්ෂාවට අනුව, නිමකළ වැඩවල තක්සේරු කළ වටිනාකම රු.114,288 ක් වුවත්, රු.173,740 ක් ගෙවීම් කර තිබුණි. මේ අනුව, රු.59,452 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.6** **කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

**මාර්ගවලට බොරළු දැමීම**

**--------------------------**

මුදල් කොමිෂන් සභාවේ අංක 2016/01 දරන 2015 දෙසැම්බර් 30 දිනැති චක්‍රලේඛයේ 1.2 ඡේදය ප්‍රකාරව මූලධන ප්‍රතිපාදනවලින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර පළාත් සභා මාර්ග ඉදිකිරීමේදී බොරළු යෙදීම වෙනුවට දීර්ඝ කාලයක් භාවිතා කළහැකි අයුරින් කාපට් දැමීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් දැමීම සිදුකළ යුතු බවට අවධාරණය කර තිබුණත්, එයට පටහැනි අයුරින්, සමාලෝචිත වර්ෂයේ මාර්ග 04 කට රු.870,000 ක වියදමින් බොරළු යොදා තිබුණි.

**4.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
|---|---|
| (අ) ගිණුම්කරණය | ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ ගිණුම්ගත කිරීම. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | සභාවට සේවකයින් බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් පසුව සේවකයින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |